# ශක්තිය

පොදු ජන හඬේ දෝංකාරය

තැපැල් කාර්යාලයේදී ලියාපදිංචි කරන ලදි: QD/34/NEWS/2018

fj¿u:17 l,ámh:02 wkq¾cd, ,sx.h - www.shakthiya.org 2019 ud¾;= $wfma ñ, remsh, 30.00hs


## රජයේ ඉඩම්වල 42% හොර ඔප්පු!

මෙරට ඉඩම් සඳහා ලබා දී ඇති ඔප්පු වලින් 42% ක් හොරට ලියා ඇති ඔප්පු බව රජයේ රෙජිස්ට්‍රාර් ජනරාල් චතුර විතානගේ සඳහන් කරයි ඔහු පෙන්වා දෙන්නේ උප්පැන්න සහතික වලින් 17% ක්ද විවාහ සහතිනක වලින් 13% ක්ද මරණ සහතික වලින් 11% ක්ද හොරට සකස්කර ඇති ඒවා බවයි ඉකුත් වසර 155ක් තුල නාගරික ඉඩම් බොහෝමයක් පුද්ගලයන් ෂතු කරලෙන ඇත්තේ හොරට ඔප්පු සකස්කරගෙන බවට තොරතුරු ඇති නමුත් ඒවා සම්බන්දයෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකි අන්දමට ලේඛන විනාශවී ඇති බව සඳහන් කරන්නේ යැයි ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍ය වජිර අබේවර්ධන ද පෙන්වා දී ඇතී ඉදිරියේදී හොර උප්පැන්න සහතික සකස් කල නොහැකි

ආකාරයට රහස්‍ය කේත අංකයක් යොදන බවද උප්පැන්න සහතික අංක හා ජාතික හැදුනුමුපත් අංකය එකම අංකයක් ලෙස නිකුත් කිරීමට කටයුතු කරන බවද ස්වදේශික කටයුතු අමාත්‍යාංශය සඳහන් කරයි.

# කුමන්ත්‍රණ පරදවා මෛත්‍රී මහින්ද සන්ධානය ඉදිරියට

කුමන්ත්‍රණකරුවන්ට රතු එළියක්

**සරත් පතිරණ**



**2018 ඔක්තෝමබර් 26 මෙරට ඇතිවූ දේශපාලන විප්ලවයෙන් ජනතාවාදී පුළුල් දේශපාලන බලවේගයක පදනම වැටුනි මේවන විට එම බලවේගය මෛත්‍රී මහින්ද නායකත්වයෙන් මෙරට බහුතර ජනතාව සමග පෙරට ඇදෙමින් තිබේ.**

ජනාධිපති මෛත්‍රිපාල සිරිසේන හා විපක්ෂ නායක මහින්ද රාජපක්ෂ අන්නෝන්‍ය අවබෝධයෙන් ගොඩනග මින් තිබෙන එජාප විරෝධී දැවැන්ත දේශපාලන බලවේගය විනාශ කිරීමේ කිරීමේ කුමන්ත්‍රණයට මෛත්‍රි-මහින්ද දෙපාර්ශ්වයේම ඇතැම් උදවිය එ.ජා.ප.යට උඩගෙඩි දෙමින් සිටින බවට ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ චෝදනා කරයි.

පටු දේශපාලන කෝන්ත්‍රාවලින් රටත් ජනතාවත් අගාධයකට ඇද දැමීම වහා නතර කර එම කුමන්ත්‍රණය වහා ඉවත් වන ලෙස එම පෙරමුණ කුමන්ත්‍රණ කරුවන් ගෙන් ඉල්ලා සිටී. එසේ නොකළහොත් එම කුමන්ත්‍රණය රටට හෙළිකර ඊට සම්බන්ධවූවන්ට එරෙහිව ජනතාව පෙළගස්වන බව ද එම පෙරමුණ අනතුරැ අඟවයි.

පසුගිය 2018 ඔක්තෝම්බර් 26 වැනිදා ඇතිවූ දේශපාලන පෙරළියෙන් පසු රට තුළ එ.ජා .පය හුදකලා වී ඇති බව ද, දිනෙන් දින සිදුවන එ.ජ.පය කෙරේ ජනතා කලකිරීම වසා ගැනීඑටමට ජනාධිපති මෛත්‍රිපාල සිරිසේනට එරෙහිව එ.ජා.පය ප්‍රසිද්ධියේ හා අප්‍රසිද්ධියේ සිදුකරන කෙනෙහෙලිකම් පරාජය කිරීමට මහින්ද රාජපක්ෂ විපක්ෂනායක-වරයා සමඟ එක්සත් ජනතා නිදහස් සන්ධාන මන්ත්‍රීවරු සූදානමින් සිටින බවද ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ සඳහන් කරයි.රජයේ අයවැය ඡන්ද විමසීමේ දී ශ්‍රී ලංකා නිදහස් පක්ෂ මන්ත්‍රීවරුන් ඡන්දය දීමෙන් වැළකී සිටීම යුක්ති සහගත බවද රාජ්‍ය නායකයා ලෙස මෛත්‍රිපාල සිරිසේනට හෝ ඔහුගේ මන්ත්‍රී කණ්ඩායමට අයවැයට විරුද්ධ ඡන්දය පාවිච්චි කළ නොහැකි බවද එම පෙරමුණ පෙන්වා දෙයි.




# සම්පන්දන් රජයට අනතුරු අඟවයි

**චේතිය ගොඩකන්ද**

එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සලය ශ්‍රීලංකාව සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීමට රජය අපොහොසත් වුවහොත් බරපතල ප්‍රතිවිපාක වලට මුහුණ දීමට රජයට සිදුවනු ඇති බව දෙමළ ජාතික සන්ධානය රජයට අනතුරැ අඟවා තිබේ.

එම සන්ධානයේ නායක පාර්ලිමේන්තු මන්ත්‍රී අර්. සම්පන්ධන් මේ සම්බන්ධයෙන් අදහස් දක්වමින් පෙන්වා දී ඇත්තේ එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස් මිචෙල් බැච්ලට් - (**Michelle Bachelet**) ඉකුත් 8 වනදා ප්‍රකාශයට පත්කර ඇති ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වු යෝජනාවන් දෙමළ ජාතික සන්ධානය සම්පූර්ණයෙන්ම පිලි ගන්නා බවයි. වත්මන් රජය ජාත්‍යන්තර ප්‍රජාවට ලබාදී ඇති පොරොන්දු රජය ඉටුකළ යුතුයි. ඒ සදහා රජයට ලැබී ඇති අවසන් අවස්ථාව මෙයයි.

මේත්වය තුල යුක්තිය ඉල්ලා පීඩාවට පත් ජනතාවගේ සුභ සාධනය සොයා බලා එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කොමසාරිස්වරිය ගනු ලබන සියලු ක්‍රියාමාර්ග සමඟඑකඟ වන බව ද සම්පන්ධන් මන්ත්‍රිවරයා සදහන් කර ඇත.

# ආර්ථිකයෙන් රට බංකොලොත් ?

**සරත් පතිරණ**

ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය කඩා වැටී රට ආර්ථික වශයෙන් බංකොලොත් වීමේ අවධානමක් ඇති බව විගණකාධිපති ගාමිණී විජේසිංහ සඳහන් කරයි.

රාජ්‍ය ආයතන බොහොමයක කාර්ය සාධනය ඉතා දුර්වල මට්ටමක පැවතීමත්,ණය බර වැඩිවීමත්, අය-වැය පරතරය ඉහළ යාමත් හා වෙළඳ පරතරය ඉහළ ගොස් රජයේ ඒකාබද්ධ අරමුදල ඍණ අගයක පැවතීමත්, නිසා මේ තත්ත්වය උද්ගතව ඇති බවද විගණකාධිපතිවරයා පෙන්වා දෙන්නේය.

02 පිටුවට

ශක්තිය
– fmdÿck yfå fodaldrh –
49/1, විනයලංකාර මාවත, කොළඹ 10.
ෆැක්ස්/දුරකථන: 0112684820
විද්‍යුත් තැපැල: shakthiya85@gmail.com
වෙබ් අඩවිය: www.shakthiya.org

# අට්ටාල ආණ්ඩුවේ අබලං අයවැය

පසුගිය ඔක්තෝබර් 26 වෙනිදායින් පසුව බටහිර ආධිපත්‍යයෙන් දෙමළ සන්ධානයේ කොක්කේ එල්ලී රට පාලනය කරන ආට්ටාල ආණ්ඩුවට පූර්ණ අයවැයක් ඉදිරිපත් කිරීමට අයිතියක් හෝ යුක්තියක් නොපවතී.

එබැවින් මෙම අය වැය පාර්ලිමේන්තුවේදී සම්මත වුවත් එය ලත් තැනම ලොප් වන වටිනාකමක් නැති කොලකැබැල්ලක් පමණි. ලොකුවට ගණන් හිලව් ඉදිරිපත් කළත් ඒ කිසිවකටත් යථාර්තයේ ඉඩක් නැත. භාණ්ඩාගාරයේ මුදල් නැති මුදල් ලබා ගත හැකි මාවතක්ද පෙනෙන්නට නැත. මුදල් ලබා ගත හැකි වන්නේ දූපතේ කැබලි විදේශිකයින්ට විකුණා ගැනීමෙන් හෝ උගස් කිරීමෙන් පමණි.

එම පිලිවෙතට බලය ලබා ගෙන ඇත්තේ ඇමරිකානු එක්සත් ජාතීන්ගේ තානාපතිනිය වූ සමන්තා පවර්ගෙන් මුදල් ඇමති මංගලට ලැබුණු අදෘශ්‍යමාන බලය ආරූඪ කර ගැනීමෙනි. ඔබමාගේ පාලන සමයේදී මැදපෙරදිග යුද්ධය ඇවිලවීම, මියන්මාරයේ හා යුක්‍රේනයේ ගැටුම්වලදී ඇමරිකානු - ඊශ්‍රායල් මිනිමරු ස්ථාවරයන් මානව හිමිකම් කඩතුරාවෙන් මුවාකරනු ලැබූ නිරූපිකාව වූයේ සමන්තා පවර්ය. ඇය මානව හිමිකම් මෙන්ම මංගල අමාත්‍යවරයා ඇලුම් කරන චර්යාවන් පිලිබඳවද සමීප දැනුවත්කමකින් යුක්ත වන මිතුරියකි. බිඳවැටුනු යහපාලන මර උගුල යූ . ඇන් . පී. අට්ටාල ආණ්ඩුවක් බවට පත් කර ගැනීමට බෙහෙවින් උදව් කලේ ඇයයි. ප්‍රජාතන්ත්‍රවාදය ආරක්ෂා කර ගැනීමේ නාමයෙන් දක්ෂිනාංශය පාරට ගෙනඒමට සූදානම් කලේද ඇයගේ උපදෙස් මතයි.

යූ. ඇන්. පී. ආණ්ඩුවට ඇමරිකාවෙන් ඩොලර් මිලියන 500ක්ද, යුරෝපා හා ජපාන හවුලෙන් ඩොලර් බිලියන 14ක් ද සපයාදීමට කරුණු දැක්වූයේ ඇයයි. මෙවර අබලං අයවැය ගොතා ඇත්තේද ඇමරිකානු නිලධාරිනියගේ නූල් සූත්තරය අනුව බව මොවුන්ගේ මිතුරු ආමන්ත්‍රණ විලාශයෙන් පෙන්නුම් කරයි. 2005-2014 කාලය තුල ලබා ගත් ණය ප්‍රමාණය රු. ට්‍රිලියන 5ක් වූ අතර 7% ක් වූ සීඝ්‍ර සංවර්ධන වේගයක් රටතුල පෙන්නුම් කලේය. එහෙත් රනිල්-මංගල පිලිවෙත අනුව 2015-18 කාලය තුල රු. ට්‍රිලියන 5ක් ණය ලබා ගත් අතර සංවර්ධන වේගය 35% කටත් අඩුවෙන් ආර්ථික සංවර්ධනය පසු බැස ඇති 2005 වන විට ඒකපුද්ගල ණය ප්‍රමාණය රු. ලක්ෂ 108 කි 2018 වන විට ඒක පුද්ගල ණය ප්‍රමාණය රු. ලක්ෂ 5කට ආසන්න වෙමින් තිබේ මෙයින් පෙනී යන්නේ මොවුන් ණය ලබා ගෙන සිදු කර ඇත්තේ රටත් ජනතාවත් ණය කිරීමත්, මහබැංකුව ඇතුලු රාජ්‍ය දේපොල කොල්ලකෑමේ මහා පරිමාන ව්‍යාපෘතිය. මෙවර අයවැයෙන් මුදල් ඇමතිවරයා තවදුරටත් උත්සාහ කරන්නේ නිදහස් අධ්‍යාපනය හා නිදහස් සෞඛ්‍ය පහසුකම අවසන් කිරීමේ සැලසුම දියත් කිරීමටයි. ඒ සඳහා විශ්ව විද්‍යාලවලට ඇතුලත්වීමට අපේක්ෂා කරණ සිසුන් සඳහා ලක්ෂ 12 දක්වා 3% බැගින් වූ වාර්ෂික පොලියක් සහිතව ණය ලබා ද, වසර දෙකකින් පසුව ණය ණය ගෙවීම ඇරඹීමට යෝජනා කරයි එම මුදල වසර 5කි තිස්සේ ගෙවී යනවා නම් මසකට රු. 25000/- පමණ ණය වාරිකය හා පොලීයක් ගෙවීමට සිදුවේ. ඔහුට රැකියාවක් සොයා ගත නොහැකි වුවහොත් දෙමාපියන්ගේ දේපොල ද උගස් වී උගත් සිසුවාද හිඟන තත්වයකට පත් කරන මාවත මංගල-පවර් එකතුව සකස් කරදී තිබේ මෙයින් නිදහස් අධ්‍යාපනයට වෙන් කරන මුදල් පුද්ගලික අංශයේ උසස් අධ්‍යාපන ආයතන පොහොසත් කරවීමට හැරවේ සිසුවා හා දෙමාපියන් ණයකරුවන් කරන අතර අධ්‍යාපනයෙන් මුදල් ගරා ගන්නේ පුද්ගලික අංශයේ ව්‍යාපාරිකයායි. සෞඛ්‍ය සඳහාද කොම්පැනි රක්ෂණ ක්‍රම හඳුන්වා දෙන්නේ එම පිලිවෙත අනුවය. නිදහස් සෞඛ්‍ය යටතේ රෝහල්වල බෙහෙත් නැති පහසුකම් නැත. රක්ෂණ අරමුදලේ පමණට පුද්ගලික රෝහල් මගින් ප්‍රතිකාර ගත හැකිය. අවසානයේ මෙම අයවැයෙන් එලිදක්වා ඇත්තේ සාමාන්‍ය ජනතාවගේ ජන ජීවිතය වනසන පිලිවෙතක්ය.




යූ. ඇන්. පී . විරෝධී පුළුල් සංධානය ගොඩනගමු, යනමැයෙන් රත්නපුර නගරයේ පසුගියදා සමාජවාදී ජනතා පෙරමුණ විසින් කැදවනු ලැබූ රැස්වීමට වාසුදේව, විමල් වීරවංශ, ගම්මන්පිල, රහුබද්ධ, වයි. පී. පද්මසිරි, වීරසුමන, කරුණාපාල, කලංසූරිය යන සහොදරවරුන් සභාව ඇමතූ අතර, අරමුණ පැහැදිලි කිරීම නමින්ද අනුරප්‍රිය සහෝදරයා විසින් සිදුකරන ලදි.






යූ. ඇන්. පී . විරෝධී එක්සත් ජනතා බලයක් ගොඩනගමු යනුවෙන් දිවුලපිටියල වැලිහිදදී ධම්මික සංජීව සහෝදරයාගේ නායකත්වයෙ-න් පැවති රැස්වීමට වාසුදේව නානායක්කාර සහෝදරයා, සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, මැතිනිය ඇතුලු කතිකයින් රැසක් අදහස් දැක්වියග එම රැස්වීමට ප්‍රථම, දින 52 ආණ්ඩුව මගින් වෙන්කල ප්‍රතිපාදන යටගෙත් ඉදිකළ මාර්ගය වාසුදේව සහෝදරයා විසින් විවෘත කරනලදි.



පසුගියදා ඇඹිලිපිටිය තරිඳු හොටලයේ සම්සන්ත්‍රණ ශාලාවේදී ප්‍ර.වා.පෙ. 7වන නියෝජිත සම්මේලනය පිළිබද සාකච්ඡාව පැවැත්විනි. දේශපාලන යෝජනාව ඉදිරිපත් කිරීම වාසුදේව සහෝදරයා සිදුකළ අතර සංවිධායක යෝජනාව ඉදිරිපත් කිරීම තිලකසිරි සහෝදරයා විසින් සිදුකරන ලදි. ප්‍රාදේශිය සභා මන්ත්‍රී සමීර සහෝදරයා ඇතුළු නියෝජිත පිරිසක් සහභාගී විය.

### නුවරඑළිය දිස්ත්‍රික් සමුළුව තලවාකැලේදී

ප්‍ර. වා.පෙ. නුවරඑළිය දිස්ත්‍රික් සමුළුව ජෝතිවේල් සහෝදරයාගේ නායකත්වයෙන් තලවාකැලේ නව තානායම් ශාලාවේදී පැවැත්වුනි. සභාපති නාගලින්ගම් සහෝදරයා මුලසුන හෙබවීය.



## පළමු පිටුවෙන්...

### ආර්ථිකයෙන් රට...

දේශිය කෘෂිකර්මාන්තය නගාසිටුවා විවෘත ආර්ථිකය තුළ තුළ ආනයනය කරන ආහාර ද්‍රව්‍ය ඇතුළු භාණ්ඩ සඳහා සීමා පැනවීමත් ශක්තිමත් ආර්ථික ප්‍රතිපත්තියක් සකස් කිරීමත් සඳහා රජය වහා වහාම මැදිහත් විය යුතුව ඇති බවද ඔහු පෙන්වා දෙන්නේය. ආර්ථික ප්‍රතිපත්ති හා ක්‍රියාමාර්ග සැකසීම රටේ අභ්‍යන්තර කාරණයක් බැවින් මෙරට රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආර්ථික විද්‍යාඥයින් හා විද්වතුන් සහභාගි කරවා ගෙන මෙරටට ගැළපෙන නිවැරදි ආර්ථික ප්‍රතිපත්ති සකස් කර ක්‍රියාත්මක නොකළ හොත් ඇතිවිය හැකි විපාක ප්‍රබල විය හැකි බවද හෙතෙම පෙන්වා දෙන්නේය.

# ජනතාව බිලිය කරා ගෙනයන මහා සන්ධානයක්

**රටතුල ගිණියම් වූ කාලගුණික තත්වයක් පෙන්නුම් කරයි. අහස කලු කලත් වැස්ස නොලැබේ. ඉර මුදුන්වීම නිසා දැඩි දාහයක් පවතී. එහෙත් අප කුඩා දුපතක් නිසා රටපුරා හමන සුලඟ නිසා අනෙකුත් රටවල මෙන් විශාල හානිදායක් නැත ගොවියෝ යුහුසුලුව බත ගෙට ඇදගනිති. වී වලට ගෙවන අඩු මිල නිසා ගොවියෝද සිටින්නේ ගිණියම් වූ මනසකි. ජනපති ගොවි පුතෙක් වුවත් තවමත් සහතික මිලට වී මිලදී ගැනීම සිදු නොවන්නේ කෘෂිකාර්මික ඇමතිවරයා හා මුදල් ඇමති යූ.ඇන්.පි . පාන්කඩයන්වීම නිසා විය හැකියි. කෙසේවුවත් විපතට පත්ව ඇත්තේ ගොවි ජනතාවය. ඒ නිසා වහාම යහපාලන මලඉලව්වෙන් ගැලවී ඡන්ද මාවතකට ගමන් කිරීමට ජනතාව පෙල ගැස්වීම ජනාධිපතිවරයාගේ හා විපක්ෂ නායකවරයාගේ වගකීම වන්නේය. එම දේශපාලන උනුසුමින් සමාජයම කුලුගැන්වෙමින් තිබේ.**

## අයවැයේ පරස්පරය.

මෙවර අයවැය වඩාත් නව ලිබරල්වාදයේ අත් අන්ඩක් ලෙස ඉදිරිපත්වී තිබේ. එය එක් අතකින් ඔවුන් කියන ලෙසම අහස් මාලිගා අයවැයකි. උඩබලාගෙන දුවමින් ගල් බොරලුවල පය පැටලී වැටී මුනකට සමතලා වියහැක. ලෙස සියලු අයවැය යෝජනා ඉදිරිපත් වී තිබේ. ආණ්ඩුවට මුදල් නැත. භාණ්ඩාගාරය හිස්වී තිබේ. ඔක්තෝබර් 26 ආණ්ඩුව මාරුව හා අධිකරණ තීරණය ලොවට පෙන්නා ප්‍රජාතන්ත්‍රය පිහිටුවීමට බව අඟවා ඇමරිකාව, ජපානය, යුරෝපා කොමිසම එකතුව ලබා ගත් ආධාරයද වහා හිදී යමින් තිබේ. ඇමරිකාවට ත්‍රිරිකුණාමල වරාය යුද්ධ කඳවුරකට විකුණා මුදල් ලබා ගැනීමට දැමූ කෙටි කාලීන සැලැස්ම එක් අතකින් වාසුදේව මන්ත්‍රිවයාගේ ප්‍රශ්ණ කිරීම් නිසාද, අනිත් අතින් දයාසිරි ජයසේකර මන්ත්‍රිවරයාගේ හැගිස්වීම් නිසාද, අගමැති රනිල්ගේ කටේ පිට්ටු හිටවී සිටි විලාශය රටටම දැකගත හැකි විය. ඒ නිසා අය වැයට අවශ්‍ය මුදල් සම්පාදනය කර ගැනීමට නම් අනිවාර්යෙන්ම දූපතේ ඉතිරි ඉඩකඩම් හා රාජ්‍ය දේපොල විකුණා දැමීම හා රට උකස් කිරීම හැර වෙනත් මාවතක් යූ.ඇන්.පී. තක්කඩි හොර නඩයට නැත. එනිසා උපාධිය සඳහා සිසුන්ට ණය දී මතු පරපුරද විදේශයන්ට විකිණීමේ සැලසුම සමඟ නිදහස් අධ්‍යාපනයට වල කැපීම සිදු කරගෙන යයි. සිසු රක්ෂණයද විදේශික සමාග මකට ලබා දෙන්නේ රක්ෂණ සංස්ථාව බංකොලොත් කර දමා නැවත අඩු මුදලකට එම දේපොල විදේශයන්ට පවරාදීමටයි. පසුව මුළු ජනතාවම සෞඛ්‍ය රක්ෂණයට බැඳ දමා නිදහස් සෞඛ්‍ය සේවය අතුගා දැමීම සෞඛ්‍ය ඇමති ඇතුලු යූ.ඇන්.පී. පාලනයේ ඊලග ක්‍රියාමාර්ගයයි.

## යූ.ඇන්.පි.යේ අවසන් ගමන්.

තාවකාලික මහින්ද ආණ්ඩුවට විරුද්ධව අධිකරණ ක්‍රියාමාර්ග ගැනීමට බල කිරීමෙන් අනතුරුව විදේශක බලවේග විසින් යූ.ඇන්.පී. ආණ්ඩුව දෙමළ ජාතික සන්ධානයේ කොක්කේ එල්ලා ඇත්තේ පනපිටින් හම ගැසූ සතෙකු ලෙසය. එනිසා යූ.ඇන්.පී.ය මේ මොහොතේ පෙන්වන්නේ වේදනාවෙන් දැඟලීම පමණකි. දෙමළ සන්ධානය එක් පසකින්ද, පිහි මදිමින් මුස්ලිම් කොන්ග්‍රස්වරු තවත් පසකින්ද, වතු කම්කරු ජනතාවද, නගරයේ වැඩකරන ජනතාව හා ශිෂ්‍යයන්ද මියයාමට නියමිත යූ.ඇන්.පී. කුණා වටකරගත් රකුසන් රැලක් මෙන් හැම පැත්තෙන්ම යවුල්වලින් අනිමින් ඇත. කොක්කේ එල්ලී පන ගැහෙන යූ.ඇන්.පී.යට කළ හැකි දෙයක් නොමැති අතර අගමැතිවරයා සිදු කරන්නේ ඡන්ද මාවතින් ගෙල සිඳින තෙක් කරන තප්පුලැමකි. විදේශික බලවේග යූ.ඇන්.පී.ට බල කරමින් සිටින්නේ ඡන්දය කල්දමා, පාර්ලිමේන්තු කාලය දික් කර, නව ව්‍යවස්ථාවක් අටවා රට බෙදීමට සැලැස්මක් දියත්කර, විදේශ හමුදා කඳවුරු උතුරු නැගෙනහිර පිහිටුවා ගැනීමට අවස්ථාව පාදා ගැනීමය. එවැන්නක් සිදු කරනවා නම් ඔවුන් ආයෝජනය කිරීමට රනිල්ට කැමැත්ත ප්‍රකාශ කර තිබීම නොරහසකි.

## ඉන්දියන් සාගරයේ අවි හරඹය

චීනයේ මුහුදු සේද මාවත හරස් කිරීම සඳහා ඇමරිකානු රජයේ බලපෑම මත සිංගප්පූරු ගිවිසුමත්, ඇමරිකානු යුද්ධ ගිවිසුම අලුත් කර ගැනීමත්, ලහි ලහියේ සිදු වූ අතර, ඉන්දියන් සාගරයේ මෙහෙයුම් සඳහා ඇමරිකානු නාවික හා ගුවන් හමුදා ක්‍රියාත්මකවීම ආරම්භ වී තිබේ. එයත් සමඟ ඉන්දියාව කලබලයට පත්වී රුසියාව සමඟ යුද්ධ ගිවිසුම් අත්සන් කෙරුනි. එයට ප්‍රතිචාර දැක්වීමට ත්‍රස්තවාදීන් ලවා ඉන්දීය හමුදාවට ප්‍රහාරයක් එල්ල කර තිබේ. එහෙත් පකිස්ථානය හා ඉන්දියාව ඉතා ඥානාන්විතව ක්‍රියාත්මක වෙමින් පොදු සතුරා හඳුනා ගෙන කටයුතු කරන ආකාර පෙන්නුම් කරයි. එහි ඊලඟ පියවර ලෙස ඉන්දියානු - රුසියා මිසයිල් ගිවිසුමට අමතරව, සබ්මැරීන් ගිවිසුමද අත්සන් කර ඇති අතර, ඉන්දියානු සාගර කලාපයේ මෙහෙයුම් වලට එම සබ්මැරීන් මුහුදු බලය යෙදවීම ආරම්භ කර තිබේ. ඒ නිසා ශ්‍රී ලංකාව විදේශික බටහිර උවමනාවට යූ.ඇන්.පී.ය යොදවා මසට කැපකල ඌරෙක් මරණ මංචකයට දක්කාගෙන යාම ලෙහෙසි නොවනු ඇත. ඇමරිකානු අධිරාජ්‍යවාදී බටහිර ක්‍රියාකාරිත්වයට එරෙහිව ඉන්දියානු රුසියානු ආරක්ෂා ජාලයට ශ්‍රී ලංකාවද ඇතුලත් වන නිසා නව මාවතක් මතුවීමේ ලක්ෂණ පෙනෙන්නට තිබේ. විශේෂයෙන් අප්‍රේල් මාසයේ ඉන්දියාවේ පැවැත්වෙන මහා මැතිවරණයත් සමඟ මෝඩිගේ දක්ෂිණාංශික ගමන අවසන් වී ප්‍රාන්ත රාජ්‍යයන් හා කොන්ග්‍රසයද කොමියුනිසවරුද වාමාංශික ප්‍රජාතන්ත්‍රවාදීන්ද බලවත් වූ රජයක් බිහිවීම කිසිවෙකුටත් නැවැත්විය නොහැකිය. බොහෝවිට දකුණු ප්‍රාන්තීය නායකත්වය යටතේ අගමැති තනතුර ලංකාවට හිතවත් ආන්ද්‍රා ප්‍රදේශයේ නායිඩු වැනි කෙනෙකුටද ලැබීමට ඉඩ ඇත. එයත් සමඟ මෙතෙක් ලංකාවේ පැවති යහපාලන කෝලම් නැටුම් අවසන්ව නව යුගයකට රට පත්වනු නියතය.

## මෛත්‍රී-මහින්ද සන්ධානය ඉදිරියට

මෙතෙක් කලක් යූ.ඇන්.පී.ය බඩපිනුම් ගසන්නේ මෛත්‍රී මහින්ද මහා සන්ධානය හදා ගැනීමට එකිනෙකා සිදු කරන කේවල් කිරීම් නිසාය. දෙපාර්ශවයටම ශ්‍රී ල.නි.ප. ජන බලවේගවල පැවැත්මට එහා ගිය වාමාංශයක් හෝ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී රූපයක් පෙනෙන්නට නැත. මෙවර වෙනසකට වුයේ අභ්‍යන්තර ආරවුල් නිසා ශ්‍රී ල.නි.ප. දක්ෂිණාංශික බලවේගය යූ.ඇන්.පී.යට ඇදී යාමය. සිරිසේන ජනපති යූ.ඇන්.පී. විරෝධියෙක් ලෙස ජනතාව අමතාගෙන ඉදිරියට පැමිණෙන විට පැරණි කොන්තර දේශපාලන පොල්කටුවෙන, සිරිසේන මහතා වසා දැමීමට නොහැකි වනු අත. දැනට ඒකාබද්ධ විපක්ෂ ශක්තිමත් දේශපාලන පදනමක ගමන් කරයි. එහි බහුතරය පොදු ජන පක්ෂය වුවත් එය වෙන් කර වෙනම ගමනක් යාමට සූදානම් වුවහොත් යා හැක්කේ වලපල්ලට පමණය. එම පක්ෂය තාවකාලිකව ගොතාගත් අට්ටාලයකි. යූ.ඇන්.පී.ය පරාජය කිරීමට ඇති මතවාදය වම හෝ ජාතිකවාදය හෝ අධිරාජ්‍ය විරෝධය පමණක් නොව එහි සම්මිශ්‍රණයක් ලෙස පවතින ශ්‍රී ල.නි.ප බණ්ඩාරනායකවාදයේ සුභසාධන රාජ්‍ය රටාව හා නොබැඳි පිලිවෙත සමඟ ගෙතුනු මැදමාවත පොදු ජනතාවගෙන් කිසිවෙකුටත් අමතක කළ නොහැකිය. එය ඉක්මවා යා හැකි මහින්ද වාදයක් හෝ සිරිසේන වාදයක් නොමැත. එම න්‍යායික හේතු සාධකය ජනතා ගාමනයේ දිසාව හඳුනා ගැනීමට ප්‍රධානය. අනෙක අධිරාජ්‍යවාදය දුර්වල යුගයක ලෝකයේ මීලඟ දැවැන්තයින් වන්නේ ඉන්දියාව හා චීන ආර්ථිකයයි. එබැවින් එහි බලපෑමෙන් මිදී ලංකාව ඇමරිකාවේ ග්‍රහණයක් කිරීමට සිතන රනිල් - මංගල සංකල්ප අහස් මාලිගාවකට වඩා අයිස් මාලිගාවක් පමණී. ජන ගඟ රත්වන විට ඒවා සියල්ල දියවී යථාර්ථය මතු වීම නියතය. එනිසා මෙම මොහොතේ සිරිසේන හා මහින්ද දෙදෙනාම බලයට කෑදර නොවී ජනතාවට බලයක්, ජන ජීවිතයට සහනයක්, අදීන වූ ලංකාවක් ගොඩනැගීමේ සංකල්පයේ සිට නව ලිබරල් වාසිපතා හැසිරෙන අනිකුත් සියලු ඥාති මිත්‍රාදීන්ට පිටුපස හරවා ජන සටන පෙරට ගැනීමේ කාලය වහ වහා ලංවෙන බව දෙදෙනාම සිහිතබා ගත යුතුය.




**සිරිසුමන විදානපතිරන**
2019-03-15

# යූ.ඇන්.පී. ආණ්ඩුවේ ආර්ථික ව

## නව ලිබරල් වාදය ශ්‍රමයත් බුද්ධියත් සූරාකනවා ..



මහාචාර්ය තිස්ස විතාරණ

1977 ජේ.ආර්. ජයවර්ධනගේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සමග ගෝලීයකරණය හරහා නව ලිබරල් වාදය ලංකාවට කඩාගෙන බැස්සා, ඇමරිකාවේ රොනල්ඩ් රේගන්, එංගලන්තයේ මාග්‍රට් තැචර් හා චිකාගෝ විශ්ව විද්‍යාලීය ආර්ථික හවුලත් සමග ධනවාදී රටවල චින්තනය ලෙස නව ලිබරල් වාදී දර්ශනය ලංකාවට හඳුන්වා දුන්නාය ඒතුලින් ඔවුන් අදහස් කලේ යටත්විජිත වාදයට නව මුහුණුවරක් දීමයි. එහි තිබුණු සූරා කෑම එලෙසම නව ලිබරල් වාදය තුලින් ක්‍රියාත්මක වෙමින් පවතිනවා. අපේ රටේ අමුද්‍රව්‍ය ඒ රට වලට යැවීම, ඔවුන්ගේ මුදල් අපේ රටට ගේන්න, අපේ ශ්‍රමය සූරාකන්න, බහු ජාතික සමාගම් පෝෂණය කරන්න නව ලිබරල් වාදය තුලින් සිද්ධ කළා.

1978 ව්‍යවස්ථාව ලෙස එවකට ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන ඉදිරිපත් කළ ඒ විවෘත්ත ආර්ථිකය අද වන විටත් ශ්‍රී ලංකාවම අගාධයකට පත්වී ඇත්තේ ඒ නිසයි. බ්‍රිතාන්‍ය පාලන සමයේ දී ඔවුන් එදා ශ්‍රී ලංකාව පාලනය කලේ ශ්‍රමය සූරා කෑම මුල්කර ගනිමිනුයි. නමුත් අද ශ්‍රමය පමණක් නොවේ බුද්ධියත් සූරා කන තත්වයකට මේ රට පත්කර තිබෙනවා. ඒ නව ලිබරල් වාදයේ මූලික ලක්ෂණයකි. මේ රට සංවර්ධනය කරා යා යුතු නම් සූරා කෑමෙන් තොරව සමස්ථ රටවැසියාටම සංවර්ධනයේ ආර්ථික ලාභය සමව බෙදී යා යුතුයි. නමුත් රට තුළ ධනපතියන් හැරුණුකොට ඔවුන් මෙහෙයවන බහු ජාතික සමාගම් පමණක් පෝෂණය වෙමින් පවතින නිසා ශ්‍රී ලංකාව සංවර්ධිත රටක් බවට පත්කරගත නොහැකියි.

ලෝක බැංකුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, එක්සත් ජාතීන්ගේ සංවිධානය එකතුව අපේ රටේ මිනිසුන් පාගා සූරාගෙන ධනපති රටවල් පෝෂණය කරනවා. ඊකට රූකඩ පාලකයෙක් රටේ අගමැතිව සිටිනවා. ඒ රනිල් වික්‍රමසිංහයි. ඒ වගේම ඔහු හරහා විටින් විට ලංකාවට නොයෙකුත් ගිවිසුම් වාර්තා ගෙනවිත් ශ්‍රී ලාංකික ප්‍රජාව අපහසුතාවයට පත්කරනවා. ඔවුන් ගෙනා දරුස්මාන් වාර්තාව වැනි වාර්තා පසෙක තියලා, LLRC වාර්තාව වැනි වාර්තා ගෙනාවා. සිංගප්පූරු ගිවිසුම ගේනාවා.

ලංකාවට තිබෙන මානව හිමිකම් ප්‍රශ්න හෝ එවැනි ගැටළු ඔවුන්ගේ න්‍යායපත්‍රයේ කොටසක් කරගෙන නීති සැකසෙනවා. ඒවාට අපි විරුද්ධ වෙනවා. මේ වගේ කාරණා වලින් පේන්නේ රට සීඝ්‍රයෙන් එක්සත් ජාතික පක්ෂ රජය රට අගාධයට දමන බවයි. එම නිසා මුළු මහත් ශ්‍රී ලාංකික ජාතියක් ලෙස සියළුදෙනාම එකමුතුව වැඩ කරන්න කාලය එළඹිලා තිබෙන්නේ. අපේ රට තුළ එවැනි එක්සත් භාවයක් තුලින් ශ්‍රී ලාංකික ජාතියක් ගොඩනැගිය හැකියි.

## ආණ්ඩුව පළවාහරින සටන අවුලමු..



හිටපු මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල්

රනිල් වික්‍රමසිංහ නිතරම කියනවා අපේ රට විශාල ණය උගුලකට අහුවෙලා සිටින්නේ කියලා. ඒකෙන් ගොඩ එන්නත් අමාරුයි කියල තමයි කියන්නේ. එයා මේ රට 2015 දී භාරගන්නකොටත් අපේ රට ණය වෙලා තිබුණේ රුපියල් බිලියන හත්දහස් තුන්සියයක්, නමුත් පසුගිය අවුරුදු 04 තුලදී ඔවුන් රුපියල් බිලියන එකොලොස් දහස් තුන්සියයකට වඩා වැඩි ණයක් වෙලා තිබෙනවා. 2014 අග වන විට මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ ණය වීම අධික සංවර්ධනයටත් සමගාමීව රුපියල් බිලියන පන්සිය අනූ අටකි.නමුත් පසුගිය අවුරුද්දේ මැයි මාසයේ එක්සත් ජාතික පක්ෂ රජය විසින් ඇමරිකානු ඩොලර් බිලියන තුන්දහස් පන්සියයක් අරගෙන තිබෙනවා. ඊට අමතරව ණය උගුලෙන් රට නිදහස් කරනවා කියලා තනි මාසයක් ඇතුලත රුපියල් බිලියන අටසියයක් අරගෙන තිබෙනවා. එතකොට හිතන්න මේ රට යන්නේ කොහෙටද කියලා.

එහෙන් ණය ගන්නවා මෙහෙන් බදු ගහනවා අර පැත්තෙන් අතට අහුවෙන හැමදේම විකුණනවා. ඉතින් මේ තත්වය උඩ අපට වෙන්නේ මුහුදට පනින එක විතරයි. ඒකත් කරන්න බැහැ හාබර් එකත් වෙන රටවලට විකුණලා ඉවරයි. දැං අපි ආර්ථික කළමණාකාරීත්වය පිළිබඳ කථා කරමු. 2015 අග වන විට මේ ඔස්තාර්ලා රටේ දළ දේශීය නිෂ්පාදනය ගෙනල්ල තිබ්බේ ඇමරිකානු ඩොලර් බිලියන විසිහතරකට පමණයි. මහින්ද රාජපක්ෂ ආණ්ඩුව කාලේ දළ ජාතික නිෂ්පාදනය ඇමරිකානු ඩොලර් බිලියන හැත්තෑ හතරට නගගලා තිබ්බා. එක්සත් ජාතික පක්ෂ රජය ඒක වෙනස් කළා.දේශීය ව්‍යාපාරිකයින්ට දේශීය ආයෝජකයින්ට දේශීය වෘත්තිකයන්ට පහුගිය කාලේ ආණ්ඩුව උදව් කළා. පාරවල් වැනි සංවර්ධන ව්‍යාපාර වලට ලෝක බැංකුව සල්ලි වෙන් කරනකොට විදේශීය කොන්ත්‍රාත් කරුවන්ට ඒවා ලබාදෙන්න ඔවුන් යෝජනා කළා. නමුත් මහින්ද රාජපක්ෂ ආණ්ඩුව දේශීය කොන්ත්‍රාත්කරුවන්ට එම ව්‍යාපෘති භාරදීලා දේශීය කොන්ත්‍රාත්කරුවන්ගේ සේවාවක් අළුතෙන්ම හඳුන්වා දුන්නා. එවැනි දේශීය ව්‍යාපාර අපි හැදුවා. රටේම සියළුදෙනාටම සංවර්ධනයට දායක කරගන්නට පුළුවන් වුනා. ඒකෙන් රට ගැන ලොකු හැඟීමක්, ගැම්මක් ආවා, මේ රට ඒ නිසා දියුණු වුනා. ඒකෙන් රටේ ජනතාවට ප්‍රතිලාභ ගලා ආවා. එම ආර්ථික ප්‍රතිලාභ ගමට ගලා යන්නට සැළැස්සුවා. දැන් රට අගාධයට වැටිලා. පොලී අනුපාතය 75% දක්වා ඉහළ ගිහින්, ආණ්ඩුවේ බදු දෙගුණ කරලා, මේ එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව ණය ගත්තට කරන දේකුත් නෑ. කෙරෙන දේකුත් නෑ. රුපියල දරුණු ලෙස අව ප්‍රමාණයට පත් කරලා. ඉට්කා ගිවිසුම ගහන්න බැරිවුන තැන සිංගප්පූරු ගිවිසුම ගහන්න හදනවා. දෙන්න පුළුවන් හැම දෙයක්ම විදේශික රටවලට දෙනවා. ව්‍යාපාර දිනෙන් දින පිරිහෙනවා.

දැන් අපි කළ යුත්තේ මේ ආණ්ඩුව පළවාහරින්න වැඩකටයුත්තකට අත පොවන්න. ආර්ථිකය ගොඩනැගිය යුතුයි. ආර්ථික විශ්වාසය ගොඩනැගිය යුතුයි. ආර්ථිකයට නව පනක් ලබාදිය යුතුයි. අළුත් දර්ශනයකට යා යුතුයි. එය කළ හැක්කේ රාජපක්ෂ පාලනයකින් පමණයි. ආර්ථික විශ්වාසය තුලින් සංවර්ධනය කළ හැකි බව මහින්ද රාජපක්ෂ ඔප්පු කර පෙන්නුවා. උදාහරණයක් හැටියට වී වලට සහතික මිලක් ලබාදී ගොවියාත් පෝෂණය කළා. බොහෝ අය කිව්වා මේ හේතුවෙන් මිනිස්සුන්ට බත් කන්න විශාල මුදලක් වැය වෙයි කියලා. නමුත් ඒ ලාභය ගම ඇතුලටම ගිය නිසා මිනිසුන්ගේ ආර්ථික සංවර්ධනය ශක්තිමත් කළා. එම නිසා ලංකාවට අවශ්‍ය වන්නේ දේශීයත්වයට බර ආර්ථික දර්ශනයක් මිසක ණය මත යැපෙන ආර්ථිකයකට නොවෙයි.

## ප්‍රාග්ධනයට විමුක්තිය නිසා රට අගාධයකට පත්වෙලා





ශ්‍රී ලංකාවේ කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් ඩී.යූ.ගුණසේකර

අද මේ රජය කරන්නේ බහුතරයකට උවමනා දෙය නොවේ. පසුගිය කාලයේ අපි යුද්ධය ඉවර වෙලා LTTE රැඳවියන් 12000 ක පුනුරුත්ථාපනය කරන්න අපි භාරගත්තා ඒ ත්‍රස්තවාදීන් එක්කෙනෙක් වත් පුනුරුත්ථාපනයෙන් පසුව කිසිදු චෝදනාවකට හසු වුනේ නෑ. ඒ වෙනුවෙන් ක්‍රියා කළ විදිහට අනුව තමයි එවැනි දෙයක් සිද්ධ වුනේ. රටේ දේශපාලනික බල අර්බුධය නිසා, නොමග යැවීම් නිසා අධිරාජ්‍යවාදීන්ගේ උවමනා වලට රටේ එකම ජන කොටසක් වෙන් කළ නිසා එවැනි යුද්ධයක් ආරම්භ වුන බවයි මගේ හැඟීම. ඒ වගේම ඡන්දය දෙන්න අනිවාර්යයෙන්ම හැඳුනුම්පත අනිවාර්ය කරන්න තීරණ ගත්තේ බණ්ඩාරනායක යුගයේයි. කෙතරම් ආණ්ඩු මාරු වුනත් ඒක කලේ නෑ.අවුරුදු 50 කට පස්සෙ තමයි ජාතික හැඳුනුම්පත හරහා ඡන්දය දීමට තීරණය ගත්තේ .කාරණා පැහැදිලි කලේ ජාතික ප්‍රතිපත්තියක් නොමැති රටක් ගැන පැහැදිලි කරන්න. මේ තත්වය මත රුවෙලා එලි වෙනකොට රටේ අළුත් තත්වයක් බිහිවෙලා තිබෙනවා. මේ දිහා අපි විද්‍යාත්මකවයි බැලිය යුත්තේ. නිදහස ලැබුණ දා සිටමෙරට මූල්‍ය අර්බුධයක ගිලිලා තියෙන්නේ . අපට රුපියල් ඇත්තෙත් නෑ ඩොලර් ඇත්තෙත් නනෑ. නව ලිබරල් වාදයට අර්ථ දෙමින් ලිහිල් කරණය ලෙස ද, ප්‍රාග් ධනයට විමුක්තිය ලෙසද ධනපතීන් විසින් හඳුන්වන මේ ක්‍රමය නිසා රට අගාධයකට පත්වී තිබෙනවා. නිදහස් අධ්‍යාපනය, නිදහස් සෞඛ්‍ය සේවය, සුභසාධනය නැතිවෙලා තිබෙනවා. ඒ නිසා රජයක් විසින් මෙයට මැදිහත් විය යුතුයි. මහින්ද රාජපක්ෂ මහතා මෙරට එක්සත් ජාතික පක්ෂ රජයකට භාරදෙනකොට දළ දේශීය නිෂ්පාදනය 24% යි. අද 10% යි රාජ්‍ය සේවකයින්ට හා විශ්‍රාමිකයින්ට වැටුප් ගෙවුවම මහා භාණ්ඩාගාරය හිස් වෙනවා . මේවා මේ රජය විසින් ප්‍රකාශ කරන්නේ නෑ. ජනතාවට ඇත්ත කියන්නේ නෑ. රටේ සංවර්ධන කාර්යයට පාරවල් වැනි දේවල් හදන්න සල්ලි නෑ. එවැනි දේවල් කරන්න ණය ගන්න වෙනවා. එහෙම ණය අරගෙන අරගෙන අද අපි ණය උගුලක පැටලිලා තිබෙනවා. ඩොලර් බිලියන

# ැඩපිළිවෙලින් ජනතාව අනාථයි



53 ක් විදේශ විනිමය සංචිතය හිඳිලා. විදේශ රැකියා වලින් රටට ලැබුණු විදේශ විනිමයෙන් තමයි රටේ අනිත් දේවල් කළේ. ඒවගෙන් කාර් වැනි දේවල් ගෙන්න ගත්තා. දැං කාර් ගෙන්නලා තියෙනවා අපේ රටට අවුරුදු 05 කට හරියන්න. මෙවැනි වැරදි ආර්ථික ප්‍රතිපත්ති නිසා තමයි මේ රට ණය උගුලකට අහුවෙලා තියෙන්නේ. ආර්ථික විශේෂඥයින් පරීක්ෂණ හරහා වාර්ථා දීල තිබෙනවා. නමුත් මේ රජය තුට්ටුවකට ඒවා කියවන්නේ නෑ. රටේ මේ ආර්ථික ණය අර්බුධය දැනෙන්නේ පොඩි මිනිහටී 62% ක් වෙච්ච එවැනි මිනිසුන් අන්ත දුක්ඛිත භාවයකට පත්වෙලා තිබෙනවා. රජයේ රැකියා කරන අය හෝ පෞද්ගලික අංශයේ රැකියා කරන අය හෝ විශ්‍රාමිකයින් හෝ සමෘද්ධියෙන් හෝ අවස්ථාවක් නොලද මේ 62% ගොවි කම්කරු වැඩකරන අසරණ 62% ක් වෙච්ච මේ අසරණ ජනතාව මේ රටේ රජයන් තනන්නේත් මේ 62% යි. ඉතින් මේ අවිධිමත් ආර්ථික ක්‍රමය නිසා කවුරු බලයට ආවත් රට ආර්ථිකය විනාශයෙන් බේරගන්න බැරුව යනවා. ආර්ථික ක්‍රමෝපායේ ඉහළම කොටස වෙන් කරන්න ඕන ඉහත කී 62% කොටසටයි. නමුත් ක්‍රම සම්පාදනය විනාශ වෙලයි තියෙන්නේ. ඒ නිසා ආර්ථිකය අයාලේ යනවා. එක ප්‍රතිපත්තියක මෙ රට පිහිටලා නෑ, වෙළඳ ප්‍රතිපත්තියක් නෑ, අධ්‍යාපන ප්‍රතිපත්තියක් නෑ, කෘෂි කර්මාන්තයට ප්‍රතිපත්තියක් නෑ. මේ විදිහට බලපුවාම අපේ රටේ අනාගතය අඳුරුයි. ඒ නිසා ආර්ථික ක්‍රම සම්පාදනය සහිත කෘෂිකාර්මික රටක් බිහිකර ගන්නට ඉදිරියේදී අප කැපවෙමු.

## මත්ද්‍රව්‍ය, කලකෝලාහල, මිනීමැරුම්, සොරකම්වල සීමාවක් නැහැ

එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව අද වචන වලට පමණක්, සුරංගනා කථා වලට පමණක් මිනිසුන් රවටමින් නොයෙකු බොරු පොරොන්දු දෙමින්, වැඩකරන සියළු ආර්ථිකයන් කඩා වට්ටන අධ්‍යාපන ක්‍රමෝපායන



**අසංක නවරත්න ප්‍රධාන ලේකම් - ශ්‍රී ලංකා මහජන පක්ෂය.**

විනාශ කරන අටේ දේපල විකුණන තත්වයකටයි රට පත්කොට ඇත්තේ මිනිසුන්ගේ ඕනෑ එපාකම් වෙනුවට ඔවුන්ට ආවේණික න්‍යාය පත්‍රයකට විදේශීය ධනවතුන්ගේ බලපෑම්වලට යටත්ව ශ්‍රී ලාංකීය අනන්‍යතාවය විනාශ කරමින් කටයුතු කරන ක්‍රමයක් තමයි බිහිවෙලා තියෙන්නේ.

අද දරුවන්ගේ අධ්‍යාපනය, සෞඛ්‍යය පහසුකම් පිරිහිලා තියෙනවා, අවුරුදු 05 ට අඩු දරුවන්ගේ මන්ද පෝෂණය, කිරිදෙන මව්වරුන්ගේ පෝෂණය, ගැබිණි මව්වරුන්ගේ පෝෂණය, ප්‍රජා සෞඛ්‍යය වැඩසටහන් පවා ඇණ හිටි තත්වයක් තමයි පෙනෙන්නට තියෙන්නේ. නිසි ජල කළමණාකරනයක් නොමැති නිසා වගා පාළුවට යමින් තිබෙනවා, අලි සහ වන සතුන්ගේ උවදුර තදින්ම ජනතාවට බලපාල තියෙනවා, ඔවුන්ගේ දුක්ගැනවිලි මැසිවිලිවලට ආණ්ඩුව පිළිතුරු දෙන්නේ හාස්‍යයෙන් ඒ තරම් ජනතාව ඔවුන්ට විහිළුවක් බවට පත්වෙලා. එපමණක් නොවෙයි එක්සත් ජාතික පක්ෂය තුළම මෙයට අකමැති පිරිස් සහ කැමති පිරිස් අතර ගැටුම ග්‍රාමීය මට්ටම දක්වා විහිදිලා. මිනිසුන් තුල පවතින මානසික ආතතිය එලිපිට පෙනෙන්නට තිබෙනවා මත්ද්‍රව්‍ය, කලකෝලාහල, මිනීමැරුම්, සොරකම්වල සීමාවක්නැති බව පෙනෙන්නට තිබෙනවා. පාලකයාට මේ කිසිවක් අදාළ නෑ. ඔවුන් විදේශීය න්‍යාය පත්‍රයට අනුව තමන්ගේ වැඩසටහන් මෙහෙයවනවා. ඒවාට මිනිසුන්ට සොඳුරු වචන පාවිච්චි කරමින් මුළු රටම ව්‍යසනයකට පත්කොටයි තිබෙන්නේ. ඒ නිසා ජාතික නායකත්වයක අවශ්‍යතාවය මිනිසුන් අතරට දැනෙන්නට සළස්වා රට බේරා ගැනීමේ ක්‍රියාවලියට සමස්ථ ශ්‍රී ලාංකිකයන් සමග පෙළගැසෙමු.

**ණය ගත්ත අය අන්ත දුගීභාවයට පත්වී හමාරයි.**



අද රටේ න්‍යායා වෙන එකක්. ක්‍රියාත්මක වන්නේ වෙනත් දෙයකි. අධ්‍යාපනයට, කෘෂිකර්මාන්තයට, සෞඛ්‍යයට, සුභසාධනයට න්‍යායාත්මක කාරණා තිබියදී හිතුමතේ අයාල කාරණා සිදුකරන් පවතියි. එමනිසා රටට ජාතික ප්‍රතිපත්ති සම්පාදනයක් අවශ්‍යයි. මෙරටේ ආණ්ඩුවලට ජාතික ප්‍රතිපත්තියක් නෑ. ප්‍රතිපත්තිය හා ක්‍රම සම්පාදනය එක ඉලක්කයක තිබිය යුතුයි. උදාහරණයක් හැටියට බැංකු තුලින් ඕනෑ තරම් ණය ක්‍රම තියෙනවා. ඔවුන් ඔවුන්ගේ ලාභාංශ වෙනුවෙන් අසීමිත ලාභ සොයමින් වැඩ කරනවා. දේශපාලනඥයා බලන්නේ දේශපාලනය හරහා ජනතාවට විවිධ නම් වලින් ණය වැඩසටහන් හඳුන්වා දෙන්නයි, නිසි ක්‍රමවේදයක් නොමැතිව අහිංසක ජනතාව ණය උගුලේ පටලවනවා, බැංකු ණය දීම තුලින් බලාපොරොත්තු වන්නේ නැති බැරි අය ඇති හැකි අය කරවීමටයි. නමුත් නැති බැරි අය තව තවත් ණය උගුලට හසුකොට අන්ත අසරණ තත්වයට පත්කොට තම සන්තකයේ දේපල පවා නැතිකරන ක්‍රමවේදයක් තමයි සිද්ධ වෙන්නේ. ඉන් පසු දුගීභාවය තුලින් ඔවුන් සමෘද්ධිලාභීන් කොට රජය විසින් සමෘද්ධිය වැඩිකළා කියලා සතුටුවෙනවා.

බංගලාදේශයේ යූනුස් මහාචාර්ය වරයා එරටේ විශ්ව විද්‍යාල කථිකාචාර්යවරයෙක් පමණක් නොව ආර්ථික විශේෂඥවරයෙක් තම ශිෂ්‍යයන්ගේ අභියෝග නිසා ලෝකයට ක්ෂුද්‍ර මූල ණය ක්‍රමය හඳුන්වා දුන්නේ ඔහු විසිනි. අද රටවල් එකසිය විසි ගණනක මේ ක්ෂුද්‍ර මූල ණය ක්‍රමය ක්‍රියාත්මකයි. ප්‍රොබරා ග්‍රාමයේ ඩොලර් 27 ක් වියදම් කොට ක්ෂුද්‍ර මූල ණය ක්‍රමය තුලින් දුගී භාවය නැති කිරීමට යූනුස් මාහාචාර්යවරයා සමත් වුනා අද ශ්‍රී ලංකාවේත් ක්ෂුද්‍ර මූල ණය ක්‍රමය ක්‍රියාත්මකයි. නමුත් දුගීභාවය වෙනුවෙන් ශ්‍රී ලංකාව තුල ක්‍රියාත්මක වන බවක් පේන්නට නෑ. මා වයඹ සංවර්ධන බැංකුවේ සභාපතිවරයා හැටියට සිටි කාලයේ කිරි නිශ්පාදනය වෙනුවෙන් ක්ෂුද්‍ර මූල ණය වැඩසටහන් ක්‍රියාත්මක කළා. කිරි ගොවියාගෙන් අඩු මිලට බහු ජාතික සමාගම් කිරි මිලදී ගත්තා. හැමදාම කිරි ගොවියා අන්ත අසරණභාවයට පත්ව සිටියා. ඔවුන්ගේ ශ්‍රමයට නිසි මිලක් නොලැබීම ඊට හේතුවයි. මා කිරි ගොවියා නිශ්පාදක ලෙසත්, දියර කිරි මිලදී ගෙන රැකියා විරහිත තරුණයන් කිරි හලවල් සෑම පාසලක් ළඟ, රෝහලක් ළඟ, වැඩපලක් ළඟ, මහජනතාව ගැවසෙන තැන්වල විකිණීමට සැළැස්සුවා. නමුත් මෙය බහුජාතික සමාගම්වල සිත් රිදවීමක් බව තේරුම් ගන්නටත් රජයේ ඇස් ඇරෙන්නටත් හේතුවක් වූ නිසාම අවසානයේ රජය විසින් එකී බහු ජාතික සමාගම් සතුටු කරන්නට කිරි මිලදී ගන්නා ලීටරයක ප්‍රමාණය වැඩි කොට ස්වයං රැකියාවේ යෙදුන තරුණයන්ගේ රැකියාවන් අහිමි වන තත්වයට වැඩ කටයුතු සිදුකළා. අද වන විට දියර කිරි සඳහා සහතික මිල බහු ජාතික සමාගම් විසින් පාලනය කරන නිසා කිරි ගොවියන් අන්ත අසරණභාවයට පත්ව සිටිනවා.

බැංකුකරු නිතරම සුරක්ෂිතභාවයට, ඇපකරයන් වලට, සාමාන්‍ය මිනිසුන්ට ණය සඳහා සහණයක් ලෙස වැඩ කරන්නේ නෑ. නමුත් සාමාන්‍ය මිනිහාට තම වෘත්තිය දියුණු කර ගැනීම සඳහා එකී ණය මහමෙරක් නමුත් එවැනි සරළ ක්‍රමවේදයකට හෝ රජය සාමාන්‍ය ජනතාව වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ. දැන් ඉන්දියාව සංවර්ධිත බැංකු රජයට පවරා ජනතාව වෙනුවෙන් ණය වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. ඔවුන්ගේ මහ බැංකුව විසින් වාණිජ බැංකු පරිපාලනය කරනවා. එකී වෙනස වත් අපේ රජය අතට ගෙන නැහැ. ඒ වගේම කෘෂි කර්මාන්තය පිරිහෙන්නේ නිශ්පාදන සමතුලිතතාවය නැති නිසා. පළාතක වට්ටක්කා කුණු වෙනවා, තව පළාතක වට්ටක්කා වැලක් දකින්න නැහැ, මේ නිසා නිශ්පාදන කෘෂි ආර්ථිකයට ගලපන්න රාජ්‍ය මැදිහත් වීමෙන් නිසි හැසිරවීමක් කළ යුතු වෙනවා, එයද රජය විසින් ඉටු කරන්නේ නෑ. විදේශ ණය මත ස්වයං රැකියා වැඩපිළිවෙලවල් සකසා ණය වැඩසටහන් ක්‍රියාත්මක කරනවා. ඔවුන්ගේ ව්‍යාපෘතිය වන්නේ දුගීභාවයෙන් පෙලෙන මිනිසුන්ට ණය දීමයි. පසු විපරමක් නෑ, ආදායම් ඉහළ දැමීමේ ක්‍රමෝපායක් නෑ, අහිංසක මිනිසුන් පිට රටටත් ණයකාරයෝ කරනවා. ඒ වගේම අපේ රටේ බැංකුවල ප්‍රගතිය බලන්නේ ණය කොපමණක් දුන්නාද, ණය කොපමණක් ලැබුණාද, පොලී කොපමණක් එකතු වුනාද කියන මිණුම් දඬුවලට පමණයි. එය ආශ්වාදජනක ලෙස රජය විසින් ප්‍රචාරයේ යෙදෙනවා. නමුත් ණය ගත්ත මිනිහාගේ ප්‍රගතිය බලලා නොවෙයි එම මිණුම් දඬු සකසන්නේ. ඒ ගැන හොයලා බැලුවහ ඔවුන් අන්ත දුගීභාවයට පත්වී හමාරයි.

**සාකච්ඡා කළේ**
ජනබන්දු සේනානායක



# මාරසීන් වලින්ම මරු වසඟයට යන මාවතට...

අධිරාජ්‍යවාදීන් ඔවුන්ගේ ලෝකය සූරාකෑමේ බාධාවන් ඉවත් කර ගැනීමට රනිල් ප්‍රමුඛ යූ.ඇන්.පි. ඒජන්තයින්ව නැවත රාජ්‍ය බලය අත්පත් කර දීමට එකම කඳවුරකට පෙල ගැසෙනු අපට දැනග න්නට ලැබුණා. බටහිර නඩය ඔවුන්ගේ ප්‍රවේශය සුජාත කිරීමට ප්‍රජාතන්ත්‍රවාදය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, පාර්ලිමේන්තු සම්ප්‍රදාය ආදී ශුද්ධ වූ කරුණු කරලියට ගෙන එමින්ද, යූ.ඇන්.පි.යට නැවත රාජ්‍ය බලය නොදුන හොත් ආර්ථික සම්බාධක පනවන බවටත් නොනවත්වා අපට තර්ජනය කලා. බටහිර බලවතුන්ගේ ශක්තිය හා මඟපෙන්වීම මත කථානායකද, නව ජීවයක් ලබා ස්වකීය අණ්ඩපාල භූමිකාව පාර්ලිමේන්තුව තුල ගාම්භීර ලෙස රඟදක්වමින් උප්පරවැට්ටි යොදා නැවතවරක් යූ. ඇන්. පි ආණ්ඩුවක් අටවා ගැනීමට සිය දායකත්වය දුන්නේය.

අනේ දෙයියනේ, එදා පාර්ලිමේන්තුවේ 113 පෙන්නන්න කියලා පරල වෙලා කස්තිරම් ඇල්ලූ කථානායක දැන් පූස් පැටියෙක් ගානයි. අහිංසකයි.

දැන් අලුත්ම සටන වී ඇත්තේ ජනාධිපතිතුමාට කෙලවන ක්‍රමයක් සෙවීමයි. ඒකටත් බටහිර ඒජන්තයනුයි, මානව හිමිකම් පකීර්ලය, යුරෝපා හවුලයි, ජිනීවා හාම්පුතුනුයි පෙරමුණට ඇවිල්ලා. මත් උවදුර මැඩලන්න මෙතෙක් මෙරට කිසිදු නායකයෙකු නොගත් ජනාධිපතිගේ අභීත පියවර කෙසේ හෝ පරාජය කර මෙරට තරුණ පරපුර මත් උවදුරේ ගිල්වා පාපතර පාලනයක් ගෙනයන්න ආණ්ඩවත් කැසකවනවා. ඊට ඇති එකම බාධකය මෛත්‍රී බව බටහිර කිනිතුල්ලොත් ඔවුන්ගේ මෙරට ඒජන්තයනුත් හොඳාකාරවම දන්නවා මෙරට කුඩු මාපියාවට එරෙහිව ජනාධිපති යුධ ප්‍රකාශ කළ මොහොතේ පටන්ම මෙකී මාර සේනාව එතුමා දේශපාලන වශයෙන් ඝාතනය කිරීමට අවි අමෝරා ගත්තා, චම්න්ද විජේසිරි, මුජිබර් රහුමාන්, රාවුෆ් හකීම්, රිෂාඩ් බදුර්දීන් වැනි හැංචෝ පැංචෝ යොදවා ජනාධිපතිට පහර පිට පහර දෙනවී මත් ද්‍රව්‍ය සම්බන්ධයෙන් විපක්ෂයේ භූමිකාව දෙසටත් අපි ඇඟිල්ල දිග් කිරීමට සිදුව තිබේ මත් උවදුර මැඩීමේ ප්‍රයත්නයේදී ජනාධිපතිතුමාට හැගිමුත්තම් නොකර සිය පූර්ණ සහය ලබ ාදිය යුත්තේ මෙය ජාතිය මුදා ගැනීමේ මෙහෙයුමක් වන නිසාය.

තවත් අතකින් ආණ්ඩුව ගෙන් කැබිනට් පත්‍රිකා ජනාධිපති අවලංගු කරනවා. යහපාලන ආණ්ඩුවේ වසර හතරක කාලයේ සිදුවි ඇති දූෂණ සෙවීමට ජනාධිපති කොමිෂමක් පත් කරලා ඒකෙන් තැතිගත්තු ආණ්ඩුවේ කෙරුමෝ ජනාධිපතිට ආඩාපාලි කියනවා. මේ දේශපාලන ගිනිමැලය අස්සේ ඇමතිකම් ඩැහැග න්න යූ.ඇන්.පිය ඇතුලේම බලල් පොරයක් ඊනියා ජාතික ආණ්ඩුවක් අටවා අමාත්‍ය මණ්ඩලය වැඩිකර ගෙන දේශපාලන කුම්භාණ්ඩයින්ට දොලපිදේදේනි දෙන්න බැරිව සරල බහුතරය කියන උගුලේ ආණ්ඩුව සිරවෙලා. නැවත බලය ඩැහැගත්ත දා ඉඳලා මේ මොහොත දක්වා යූ.ඇන්.පිය තකන්නේ දේශපාලන අනාථයෝ කීපදෙනෙක් අල්ලා ගෙන වරදාන දී ආණ්ඩුවේ කාලය ගෙවන තෙක් පන කෙන්ද රැකගැනීමටයි. ජාතික ආණ්ඩු විප්ජාවටත් හරහට ඉන්නේ ජනාධිපති.යූ.ඇන්.පී ආණ්ඩුවයි ජනාධිපති අතර ආරෝව නිරන්තරව මෝදු වෙමින් ඉදිරි දේශපාලන සුනාමියකට මඟ පාදමින් තියෙනවා.

මෙවර අයවැයද ඇස්බැන්දුමකි. කෘෂිකර්මය, කර්මාන්ත පිලිබඳ ප්‍රතිපත්තිය වී ඇත්තේ උකසට ණයදීමයි හැකිලෙන ආර්ථිකය තුල අලුත් ව්‍යාපාරයන් සාර්ථක වන්නේ නැති එබැවින් 2018දී එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා හුදු මෙගා සංදර්ශනයක් විය. අවම වශයෙන් මොනරාගල ප්‍රථම මෙගා සංදර්ශනයේ මංගල පංපෝරි ගැසූ වැසිකිලි 25,000 හැදීම ගැන වෙච්ච දෙයක් නැති

2018 රත්නපුරේ දිසාවේ එන්ටප්‍රයිස් ශ්‍රී ලංකා වැඩපිලිවෙලින් නව ව්‍යාපාර 20ක් වත් අලුතින් ආරම්භ කර නැති රත්නපුරේ ව්‍යාපාර 300ක් අරඹන බවට කල තප්පුලෑම ණය දෙන්න බැංකු වලට මංගල කළ බලපෑමට බැංකු කලමනාකරුවන් තම කංකෙදිරිය අත්හරින්නේ නැති ව්‍යාපෘති 300 මුදල් අමාත්‍යාංශයේ පෙට්ටගම්වල හිරවෙලී මංගලගේ සර්කස් සංදර්ශනවල මායාව ඉදිරියේදී රටට දැනගන්න පුලුවන් වේවි. ජනාධිපතිතුමා යහපාලන ආණ්ඩුවේ දූෂණ පැටිකිරිය හොයන්නත් වෙනම කොමිටියක් පත් කරලී මේ වන විට ආණ්ඩුව ගිරයට අහුවෙච්ච පුවක්ගෙඩියක් වගේ දෙපළුවීයාමේ ඉරනමට නියත විවරන ලැබී තිබේ. ඊට පෙර මෛත්‍රී හිර කරලා හෝ ඝාතනය කලා හෝ තනි බලයක් අතට ගැනීමයි. යූ.ඇන්.පියේ අරමුණ. ආණ්ඩුව මෙවර අයවැය ඉදිරිපත් කරනවිට විශේෂයෙන් ගොවිජනයා විශාල ජීවන තෙරපුමකට ලක්ව සිටියා. වී ගොවීන්ගේ නිෂ්පාදන අලෙවි කර ගැනීමට නොහැකිව වීදිවලට ඇවිත් උතුරුමැද, ඌව පලාත්වල ගොවීන්ගෙන් දැනට රුපියල් සියයකටපොරිභෝගිකයින්ට අලෙවිකරද්දී ගොවීන්ට කිලෝවකට රුපියල් 30ක් නියම කර තිබීම කවර උලාකෑමක්ද?

වියලි කලාපයේ හේන්ගොවි බිම්වල වට්ටක්කා වගාකල ගොවීන්ට සිය අස්වනු විකුණාගත නොහැකිව ලත වෙමින් සුසුම් හෙලන අයුරු මාධ්‍ය මගින් ප්‍රදර්ශනය කලී මොකාගේ හෝ ආර්ථික උපදේශක සභාවල් අහවල් එකටද?

ඇමරිකාව ඉරානයට පනවා ඇති සම්බාධක හේතුවෙන් තෙල් ආනයනයට අවහිරවීම නිසා මෙරට ආර්ථිකයට හා පොදු ජනයාට විශාල අලාභයක් විඳදරා ගැනීමට සිදුවේ ඊට ඇමරිකාවෙන් වන්දි ඉල්ලා සිටීමට මංගල හෝ රනිල්ට කොඳුනාරට් නැත්තේ ඔවුන් රූකඩ ඒජන්තයින් වෙන නිසයී

2018 වර්ෂයේදී ලෝක බැංකුව ලංකාවේ ගොවිතැන් නවීකරණය කිරීමට ඩොලර් මිලියන 2500ක විශාල ණය මුදලක් ලබා දුන් බවට හිටපු කෘෂිකර්ම ඇමතිවරයාත්, මහ බැංකු අධිපතිවරයාත් මාධ්‍ය හමු තියලා ණය මුදල ලැබීම ලොකු ජයග්‍රහනයක් බවට කයිවාරු ගැහුවා. අප නගන ප්‍රශ්ණය මෙයයි, මේ ණය මුදල යොදවා ගොවිතැන ඇතුලු කෘෂිකේෂත්‍රයේ කිරීමට යන නවීකරණය කුමක්ද? ගොවිතැන නවීකරණය උදෙසා කෘෂිකර්ම අමාත්‍යාංශය ඉදිරිපත් කළ සැලැස්ම කුමක්ද?

ආණ්ඩුවේ ණය බරට වඩා වැඩි ණය බරකට මෙරට පොදු ජනතා ගොදුරු වී ඇති එනිසා තුන්වේල දෙවේලට එකවේලට කප්පාදු කරල පිරිමහග න්න බැරිව ජනතා ජීවිත කාදමා ඇති දළඹුවා මොකාද? පීඩනයට එරෙහිව වීදි බසින ජනතාව මර්ධනය කිරීම පිනිස ආණ්ඩුව අලුත් ත්‍රස්ත මර්ධන පනතක් සම්මත කර ගැනීමට ක්‍රියාකරමින් සිටී.

**- ටිකිරි දිසානායක -**

## කවි සිතුවිලි

### අද දේශපාලනේ

| | |
|---|---|
| බෙහෙතට සොයා ගන්නට නැත | ජනමතය |
| ජන කතිරයෙන් ගියවුන් චී චී | කැතය |
| පුළුවන්කාරකම් කුඩු රජවරු | අතය |
| අද දේසපාලනය සැබැවින් | හිරිකිතය |
| පට්ටම් තානාන්තර ඉහළින් | දරතී |
| පිරිතේ, බනේ, මගුලේ ගොස් නිදි | වරතී |
| අවි අත දරා ඇති තුරු ලේ බිදු | පෙරතී |
| උතුමන් රැකවලේ සිට ඝාතන | කරතී |
| මංකොල්ලයෙන් ජයගත් ඉල්ලම් | හොරුය |
| පාලකයන්ට හිතවත් මහ රජ | වරුය |
| ශක්තිය බලය උණු උණු ඊයම් | බරුය |
| රට ඉදිරියට පාවී යන සැටි | මරුය |
| තලගොයි වෙසින් සිටියත් කලු | කබරගොයා |
| කෙරුමන් කරන තාලෙන් ගත හැකිය | සොයා |
| කර තෙක් නරකයේ බැස සුචරිතයේ | නොයා |
| අවනිතියට යති නිති හිස මුදුනෙ | තියා |
| යුක්තිය තලා පොඩි කර සේරම | හිස්ය |
| සාධාරණය වැලලුව තැන මහ | ගස්ය |
| හක්කෙ බුදුරැස්ය බොක්කේ දඩ | මස්ය |
| නීතිය කොහාද? මිනිසත්කම මිය | ගොස්ය |

**දබේගොඩ - ජිනදාස**

### පීඩිතයෝ

දැඩි හිරු රැස් හමුවේ
එරඩල පතක් වූව
යලි නැගීසිටින
ඉවක් බවක් නැතිව
ගිනි තැබුව ද
යලි නැගිටින
ගව මහීෂා දීන්ගේ කුර ගැටී
තැලී පොඩිවී ගියද
ඔවුනටද අහරක් වෙමින්ම වුව
යලි නැගිටින
ගංවතුර හමුවේ
පොවා ගියද
යලි නැගිටින
මිහි මව තුරුලේ
ඇය රැකගනිමින්ම වෙහෙසෙන
කාගේත් පයට පෑගෙන
යලි යලිත් නැගිටින
තණ කොළය.

**හිගුල - මංගල විජේසිංහ**



**1977 ජේ. ආර්. ආණ්ඩුව එල්ලකළ මර්ධනයට විරුද්ධව තුල්හිරිය පේෂකර්මාන්ත ශාලාවේ වෘත්තිය සමිතිය දියත්කළ අරගලයේදී සියලු සේවකයන් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් ඉවත්කිරීම පිළිබද නොවිසඳුණු ප්‍රශ්න රැසක් විසදාගැනීම වෙනුවෙන් සංදේශයක් අතිගරු ජනාධිපතිතුමා වෙත යොමු කිරීමට සභාපති ලියනාරච්චි සහෝදරයා වාසුදේව මන්ත්‍රීතුමා වෙත බාරදුන් අවස්ථාව.**



**යූ.ඇන්.පී. විරෝධී පුලුල් දේශපාලන සන්ධානයක් ගොඩනැගීම පිළිබඳව පසුගිය දිනක වැලිමඩදී බදුල්ල සංවිධායක උපාලි රාජපක්ෂ සහෝදරයාගේ නායකත්වයෙන් රැස්වීමක් පැවැත්විය.**

# හිංසනයට පීඩනයට අසමානතාවයට හා නූතන අධිරාජ්‍යවාදී පීඩනයට එරෙහිව

# ජාත්‍යන්තර කාන්තා දිනය සමරමු








ජාතික නිදහස් පෙරමුණට අනුබද්ධ ලක්මව දියණියෝ සංවිධානය විසින් සංවිධානය කරනු ලැබූ ජගත් කාන්තා දින සමරුවක් 2019.03. 06 කොළඹ පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවැත්විණි.

ඒ සමඟ එක්වීමට හැකිවීම සතුටට කරුණක් බව ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණේ දෙහිවල ගල්කිස්ස නාගරික මන්ත්‍රිනී ශෙරිනා මුස්තාෆා මහත්මිය සුභ පැතුම් ඉදිරිපත් කරමින් කියාසිටියාය. කාන්තා දිනය පිළිබඳව ඉදිරිපත් කර සුභ පැතුම් පනිවිඩයේ මෙසේද සඳහන් වේ.

ලාංකේය කාන්තා විමුක්ති අරගලය බටහිර ලෝකයේ වර්ධනයන්ට වෙනස්ව දිගහැරුනි. අධිරාජ්‍ය-වාදයට හා යටත් විජිතවාදයට විරුද්ධව පැන නැගුනු ජාතික විමුක්ති අරගලය සම සමාජ ව්‍යාපාරය ඔස්සේ දිග හැරුනු අතර, කාන්තා විමුක්ති අරගලයද එයට අනුසාංගික විය. නිදහස දිනාගැනීමට පෙර සිට වැඩකරණ කාන්තා නායකාවක් වූ පොන්සි නෝනා සහෝදරියත් පසුකාලීනව හිටපු අමාත්‍යවරියක් වූ දිවංගත විවියන් ගුණවර්ධන සහෝදරියත් කාත්තා විමුක්ති ව්‍යාපාරයේ ප්‍රබල නායිකාවන් විය. 1931දී ඩොනමෝර් ප්‍රතිසංස්කරණ යටතේ ලාංකික කාන්තාවන්ට ඡන්ද බලය හිමි වූයේ ආසියාවේ පලමු රට හැටියටයි. ලොව ප්‍රථම අගමැතිනිය මෙන්ම ජනාධිපතිනියද ලංකාවෙන් බිහිකර ගැනීමටද හැකිවීම කාන්තා ව්‍යාපාරයට මහත් අභිමානයකි.

වර්තමානයේ නව ලිබරල්වාදනේ හා නූතන අධිරාජ්‍යවාදී ලෝක රටාවෙන් එල්ල වෙන සූරාකෑමේ පීඩනයෙන් වඩාත් පීඩාවට පත්වන්නේ කාන්තාවන්ය. ඉන් මිදීම සඳහා දිනාගත යුතු කාන්තා අයිතිවාසිකම් රැසකි.

ශ්‍රී ලංකාවේ විදේශ ඉපැයීම් වලින් වැඩි ප්‍රමාණයක් මැද පෙරදිග සේවිකාවන්, ඇඟලුම් සේවිකාවන් හා තේ දලු නෙලන කාන්තාවන්ගේ ශ්‍රමයෙන් උත්පාදනය වුවත් ඒවා බුක්තිවිඳින්නේ සමාගම් හිමිකරුන් හා පාලක පැලැන්තියයි. ඇයගේ දරුපවුල් බොහොමයක් දුගීභාවයේ අන්තයට ගිලෙමින් සිටින අතර මහලු වියට එලඹෙන ඇයට විශ්‍රාම අයිතිය ලබාදීමටවත් රාජ්‍ය පාලකයින් කෘතඥ වී නොමැත. ඇය මිත්තනියක, මවක්, බිරිඳක්, සොයුරියක්, දියනියක් ලෙස සියලු දුක් ගැහැට විඳ දරා ගෙන ආදරය, කරුණාව, දයාව පතුරවාමින් මුලු මහත් සමාජයටම විශාල මෙහෙවරක් ඉටු කරනු ලබන්නීය.

නවලිබරල්වාදී නූතන අධිරාජ්‍යවාදය මිනිසත් බවට නිගා දෙමින් කාන්තාව වෙළඳ භාණ්ඩයක් කර ගනිමින් හැඟීම් කුප්පවා බහුජාතික සමාගම්වලට ධනය උපද්දවන ප්‍රචාරක උල්පතක් ලෙස යොදවයි. ළමා අපයෝජනය, කාන්තා හිංසනය, ගෘහ ප්‍රචණ්ඩත්වය, ගණිකා වෘතිය හා මත් ද්‍රව්‍ය උවදුර ආදිය නව ලිබරල් සමාජ ආර්ථික ක්‍රියාවලිය සමග ගොඩනැගෙන අතුරු ප්‍රතිඵලයන්ය. එනිසා 21 වෙනි සියවසේ කාන්තා විමුක්තිය වෙනුවෙන් පෙලගැසෙන සටන්කාමී නව පරපුරේ නායිකාවන් ලාංකික ස්වෛරීත්වයත්, ජාතික අනන්‍යතා-වයත් මුල් කර ගෙන නූතන අධිරාජ්‍යවාදයේ ගැත්තන් ඇතුලු සියලු ඒජන්තයන් පරාජය කිරීම සඳහා පොදු ජන බලවේගය සමඟ අත්වැල් බැඳගතයුතු බව මෙවර කාන්තා දිනයේදී අපගේ ප්‍රාර්ථනාව වේ.

පැමිණි පිරිස පිළිගැනීම ලක්මව දියණියෝ සංවිධානයේ ලේකම් හෂිනි සිල්වා මහත්මිය විසින් සිදුකරන ලදි. අරමුණු පැහැදිලි කිරීම එම සංවිධානයේ ජාතික සංවිධායිකා, හිටපු බස්නාහිර පළාත් සභා මන්ත්‍රීනී ප්‍රියන්ගා මහත්මිය විසින් සිදු කළ අතර, සමරු දේශනය ජා.නි.පේ. නායක පාර්ලිමේන්තු මන්ත්‍රී විමල් වීරවංශ මහතා විසින් පවත්වන ලදි.

## ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානය වැසීමට විරෝධය




ඇඹිලිපිටිය ආර්ථික මධ්‍යස්ථානය ආරම්භවෙන්නේ 2002 වසරේ සිටය. මුලින් ගොවීන්ට කිසිදු බදු මුදලක් නොමැතිව තම භාණ්ඩ අලවි කර ගැනීමට තිබුනත් දැන් පොල බදු ක්‍රමයක් පවතී. කඩකාමර තිබුනත් ඒවා බොහෝමයක් හිස්ව පවතී. මේ වසරේ සිට කඩ බදු තුන් ගුණයකින් ඉහල දමා ඇත.

රු 2000/ගෙවනලද අය රු 6000ක් ගෙවියයුතු වන අතර රු 3000 දැන් 9000ක් කර ඇති බව ඔවුන් චෝදනා කරති. මෙතරම් මුදලක් අයකරගැනීම අසාධාරනය. මුලින් අත්තිකාරම් මුදල් රුපියල් දෙලක්ෂ පනස්දහසක් ඇප තබාඇති බවද මේ අය කියති.

මේදිනවල එම කඩකාමර වල ව්‍යාපාර කරගෙන යන කඩ හිමියන් අඛන්ඩ සත්‍යග්‍රහයක් ආරම්භ කරමින් මෙයට කඩිනම් පිළිතුරක් බලාපොරොත්තුවෙන් සිටී.

**ඇඹිලිපිටිය වාර්තාකරු -රුවන් පතිරන**




පසුගිය දිනක ර.ලි.සේ.ස. සම්මන්ත්‍රණ ශාලාවට එක්වූ වෘත්තිය සමිති නියෝජිතයෝ සමුලුවක් පවත්වා නිලධාරී මණ්ඩලයක් පත්කර ඒකාබද්ධ වෘත්තිය සමිති මධ්‍යස්ථානය (JTUC) පිහිටුවාගත් බව ශක්තියට වාර්ථාවේ. ඉදිරියේදී යූ.ඇන්.පී මර්ධනයට විරුද්ධව සේවකයන් පෙලගැස්සවීමට ඔවුන් සූදානම් වේ.

## අපගේ ශෝකය

ප්‍ර.වා.පෙ. ප්‍රාදේශිය ප්‍රධානියෙකු වන ඇල්ලගාව මෛත්‍රීරත්න සහෝදරයා පසුගිය දිනක අප අතරින් වෙන්විය. 1980 මහ වැඩවර්ජනයේ සටන්කාමී තරුණයෙකු ලෙස වාමාංශික ව්‍යාපාරයට සම්බන්ධ වූ මෛත්‍රිරත්න සහෝදරයා අවසන් හුස්ම හෙල තෙක්ම වාමාංශිකවාදය හිතේ දරාගත් අකලංක සහෝදරයෙකි. ඔහුගේ වියෝව ගැන අපගේ ශෝකය පලකරමු.

බුත්තල ප්‍ර.වා.පෙ. හිටපු සංවිධායක හා මධ්‍යමකාරක සභික රෝහිත ජයකොඩි සහෝදරයා කලක් රෝගාතුරව සිට පසුගියදා අප අතරින් වෙන්විය. ඔහුගේ වියෝව ගැන අපගේ ශෝකය පලකරමු.

## ශක්තියට ආධාර කරන්න

මුල්‍ය දුෂ්කරතා අභිබවමින් මාස්පතා ශක්තිය ඔබ වෙත එවීමට අපි වෙහෙසෙමු. ශක්තිය පුවත්පත පවත්වාගෙන යෑම වෙනුවෙන් ඔබ ලබාදෙන වාර්ෂික දායක මුදල් හා ආධාර නිතිපතා අප වෙත ලබාදෙන්න. ඔබගේ මුදල වෙනුවෙන් රිසිට් පතක් නිකුත් කරනු ලැබේ. සියලු මුදල් පහත දක්වන අකාරයට එවන ලෙස ඉල්ලමු. මුදල් ඇණවුම් කුරුදුවත්ත තැපැල් කාර්යාලයෙන් මාරු කරගත හැකිවන පරිදි එවන්න.

**එම්.බී. සරත් පද්මදාස**
කලමනාකරු
ශක්තිය

# ශක්තිය

## මහබැංකු වංචාව පසුපස ජාත්‍යන්තරය ?



පසුගිය දිනක අතිගරු ජනාධිපති තුමා හෙළිදරව් කළ කරුණු අනුව මහබැංකු හොරකමට සම්බන්ධ ප්‍රධාන සැකකරු සිංගප්පූරුවේ සැගවී සිටියත් ඔහු අල්ලා මෙරටට එවීමට එම රජය මෙන්ම ජාත්‍යන්තර පොලිස්සියද කඩිනමින් ක්‍රීයා නොකිරීම පිළිබද ප්‍රශ්නය මතුකර ඇත.

මෙම හොරකමේ මහ මොලකරු වු අගමැති රනිල් වික්‍රමසිංහ ඇතුලු යු. ඇන්. පී. ඇමතිවරු සැගවී සිටින්නේ ප්‍රධාන සැකකරු වසන්වී සිටීම නිසා බව හැමටම පැහැදිලි වෙමින් පවතී. ප්‍රධාන සැකකරු හිටපු මහබැංකු අධිපති අර්ජුන මහේන්ද්‍රන් සගවා තබාගන ඇත්තේද ජාත්‍යන්තර බලවතුන්ගේ වුවමනාව අනුවදැයි යන සැකය ජනතාවට මතුවේ.







# • රජයේ ආයුකාලය ක්‍රමයෙන් ගෙවීයයි... • සටන් එකතු වෙමින් රටපුරා උණුසුම්... • මර්ධන නොතකා ජඩ පාලනයට විරෝධතා...

ජන පීවිතය උග්‍ර ප්‍රශ්ණාවලට මැදිවූ ජනතාවගේ උද්ඝෝෂණා විරෝධතා සහ සටන් පියවර පසුගිය සති දෙක තුනක් මුලුල්ලේ රටේ විවිධ ස්ථානයන්හි ක්‍රියාත්මක වූ අයුරු ජනමාධ්‍ය විසින් ප්‍රකාශකලත් එකී සටන්වලට හේතු වූ කිසිදු ප්‍රශ්ණයක් මේ වන තුරුත් කෙලවරක් වී නැති බව එකී සංවිධානවල නියෝජිතයෝ ශක්තියට පැවසූහ.

රජයේ ආයුකාලය ක්‍රමයෙන් ගෙවීයාම නිසා ජනතාව මහ මැතිවරණය හෝ ජනාධිපතිවරණය අපේක්ෂාවෙන් සංසුං වනු ඇතැයි ආණ්ඩුව හා විපක්ෂය දෙකම සිතුවත් ඊට වඩා වෙනස්ව යටකී සටන් අලුත් වෙමින් අනිකුත් සටන්ද එයට එකතු වෙමින් රටපුරා උනුසුම් තත්වයක් ඉදිරියේදී එන කුමණ ඡන්දයක් තුල වුවද සෑපුවම පිලිබිඹු වනු ඇතැයි ප්‍රජාතන්ත්‍රවාදී වෘත්තීය සමිති මධ්‍යස්ථානයේ ප්‍රේමලාල් සහෝදරයා ශක්තියට පැවසූවේය.

තවද මීලඟට එළඹෙන කාලය ජනතා සටන් උත්සන්න වීමට ඉඩඇති බව ස්වයංරැකියා සංගම් නායක මහින්ද කහඳගම සහෝදරයා ඊයේ (18)ජනමාධ්‍ය සාකච්ඡාවකදී ප්‍රකාශ කර ඇත.

## ජඩ පාලනය ගුරු විරෝධයට පහරදෙයි...

පසුගියදා ගුරු-විදුහල්පතිවරුන් විසින් ගෙන ගිය වර්ධන ක්‍රියාකාරිත්වය ඉතා සාර්ථක වී ඇති අතර එයට හේතු වූයේ ඔවුන් විසින් ගෙන ගිය සාමකාමී විරෝධතා ක්‍රියාකාරිත්වයට ජඩ පාලනය පොලිසිය යොදවා ගුරුභවතුන් කීපදෙනෙකුගේ ඔලුකටු කුඩුවී යන ලෙස බැටන් හා කඳුලු ගෑස් ප්‍රහාර එල්ල කිරීම නිසාය.

## ග්‍රාම නිලධාරී විරෝධයෙන් මන්ත්‍රීලා පයින් ගමන්

පසුගියදා ග්‍රාම නිලධාරී සේවකයින් විසන් ගෙනගිය වෘත්තීය සමිති ක්‍රියාමාර්ගය නිසා පාර්ලිමේන්තු පාරවල් වසා ගනිමින් හතර වටින් ප්‍රදේශය පුරා උද්ඝෝෂණය දියත් කර තිබුනි. ඔවුන්ගේ විරෝධතාවයන් මැඩපැවැත්වීම සඳහා මාර්ග බාධක යොදා තිබුණත් ඒවාද නොතකා උද්ඝෝෂකයෝ ගමන් කිරීම නිසා ආරක්ෂක නිලධාරීන් මහත් අපහසුවට පත්විය.

එපමණක්ද නොව පාර්ලිමේන්තුවට පැමිනෙන මන්ත්‍රීවරුන්ට පාරවල් අවහිරවීම නිසාවෙන් ඇතුලුවීම සඳහා පයින් ගමන් කිරීමට සිදු වූ අතර, විපක්ෂ මන්ත්‍රීවරුන්ට ඔල්වරසන් හඬ නගමින් විරෝධතාකරුවෝ උද්යෝගිමත් සටන් පාඨ ඉදිරිපත් කලේය. ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් පැමිණෙන විට උස් හඬින් විරෝධතා සටන්පාඨ ඉදිරිපත් කෙරුනි. මේවා සියල්ල අතරින් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් වාහන නවතා පයින් ගමන් කළ බව වාර්තා විය.

## එච්.එන්.ඩී හා අන්තරේ සිසුන්ට විෂ ගෑස්

පසුගිය දිනවල එච්.එන්.ඩී සිසුන් හා අන්තර් විශ්ව විද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ සිසුන් විසින් දියත් කළ සාර්ථක විරෝධතාවලදී මාර්ග බාධක බිඳ දමමින් සිසුහු දැඩික්‍රියාකාරිත්වයක් පෙන්නුම් කලහ. අධි ආරක්ෂක කලාපයට ඇතුලුවීමට සිසුන් ගත් උත්සාහයන් මැඩපැවැත්වීම සඳහා ජල ප්‍රහාර කිහිප විටක් එල්ල කලත් එය අසාර්ථක විය. මාර්ග බාධක බිඳ දමමින් ඉදිරියට ඇදෙන සිසුන් පලවා හැරීම සඳහා වෙඩි තැබීමට පෙර සිදු කරන කඳු ගෑස් ප්‍රහාරය දියත් කෙරුණි. මෙවර ඔවුන් යෙදූ කඳුලු ගෑස් විෂ සහිත වූ අතර, බොහෝ සිසුන් හුස්ම ගැනීමට අපහසුතාවයෙන් පසුවන විටදී පොලිසිය මැර බලය යොදවමින් සිසුන්ට අමානුෂික ආකාරයෙන් පහර පිට පහර දෙමින් සිසු නායකයින් කීප දෙනෙක් පොලිස් අත් අඩංගුවට ගෙන රඳවා තබා ගෙන ඇත.

යූ.ඇන්.පී ආණ්ඩුව ප්‍රශ්ණ විසඳා ගැනීමට නොහැකි වූ කළ පොලිසිය හා ආරක්ෂක අංශ මගින් උද්ඝෝෂකයින් තලා පෙලා ගෙන යන දුර්දාන්ත පාලන අවසන් කිරීමට වහාම මැතිවරණය පවත්වන තෙක් සිවිල් නීති කඩ කරමින් උද්ඝෝෂණ කිරීමට පොදු ජනතාවට ආයාචනය කරන බවද එක් සිසුනායකයෙක් ශක්තියට ප්‍රකාශ කලේය.

## රාජ්‍ය කළමනාකරන සහකාර විරෝධතාවය කොළඹ නගරය දෙවනත් කරයි

ඉල්ලීම් 13ක් මුල් කරගනිමින් රාජ්‍ය කලමනාකරණ සහකාර සේවයේ නිලධාරීන් රටපුරා ගෙන ගිය උද්ඝෝෂණ මාලාවේ අවසන් මහා උද්ඝෝෂණය පසුගිය 29 වෙනිදා කොළඹ දී පැවැත්විය. රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය දක්වා පෙලපාලියකින් ගමන්ගත් 50,000ක් පමණ වන එම පිරිස පසුව විහාර මහාදේවී උද්‍යානය අසල රැස්වීමක්ද පවත්වා විසිර ගියේය.

මෙම ඉල්ලීම් අතර ප්‍රධාන වී ඇත්තේ පරිපාලන සේවයේ මාණ්ඩලික නිලධාරීන්ට ගෙවන අතිරේක දීමනාවට ගැලපෙන ලෙස අනෙකුත් සේවකයින්ට දීමනාවක් ගෙවිය යුතු බවයි. එසේම නවක රජයේ සේවකයින්ගේ විශ්‍රාම වැටුප අහිමි කිරීම පිලිබඳවත්, රාජ්‍ය භාෂා චක්‍රලේඛයේ විධිවිධාන දෙයාකාරයකින් ක්‍රියාත්මක කිරීමට විරුද්ධවත්, ශ්‍රේණි විෂමතා හා වැටුප් විෂමතා ආදී ඉල්ලීම් මුල්කර මෙම උද්ඝෝෂණය ක්‍රියාත්මක කළ බව රජයේ සහකාර කළමනාකාරන නිලධාරී සංගමයේ ලේකම් එස්. අත්තනායක මහතා ශක්තියට ප්‍රකාශ කලේය.

## වී වලට සාධාරණ මිලක් නෑ. ගොවි ජන පෙලපාලි ඇවිලේ

රටපුරා වී අස්වැන්න නෙලන කාලය පැමිණ ඇතත්, රජය වී මිලදී ගැනීම් සිදු කරන්නේ ඉබි ගමනින්ය.

මේ නිසා පුද්ගලික අංශයේ වී මුදලාලිලාට හා මෝල් හිමියන්ට රජ මඟුලක් වී ඇත. ඇතැම් ප්‍රදේශවල සහතික මිල මට්ටමින් ඉතා පහල රු 25/- දක්වා පුද්ගලික ව්‍යාපාරිකයින් වී මිලදී ගැනීම් සිදු කරන බව ගොවි ජන සුරැකීමේ සම්මේලනයේ සභාපති ගාර්දිවසම් සහෝදරයා ශක්තියට පැවසීය.

ගොවීන්ට සිදුවන අසාධාරණයට විරෝධයපෑම සඳහා වී පාරවල්වල ගොඩ ගසා ගිණිතැබීමට ගොවියෝ සූදානමින් පසුවන අතර එම දරුණු ක්‍රියාමාර්ගයට පෙර පෙලපාලි උද්ඝෝෂණ පවත්වා රජයට බලපෑම් කිරීම ගොවි ප්‍රදේශවලින් ආරම්භ වී ඇති බව වාර්තාවේ. රජය නිසි ක්‍රියාමාර්ගයක් නොගන්නේ නම් අස්වනු ගිනිතබා ගොවිජන කාර්යාල අත්පත් කර ගැනීමේ සටන් වටයට සැරසෙන බව ගොවි නායකයෙක් ප්‍රකාශ කලේය.

**වාර්තාකලේ - ශ්‍රියා මෙන්ඩිස්**

කොළඹ 10 ස්ටාර් මුද්‍රණාලයෙදී මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදි.